(1)

(4)

# දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය

**01.** **ක්‍රියාත්මක වන දිනය** - ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට මෙම පටිපාටිය ක්‍රියාත්මක වේ.

**02.** **තනතුරු සංඛ්‍යාව** - පළාතට අයත් දිස්ත්‍රික් තුන (3) සඳහා තනතුරු 3 ක් අනුමත කර ඇත.

**03.** **වැටුප් පරිමාණය**- මෙම තනතුර ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවයේ III/II ශ්‍රේණියේ තනතුරකි. ඒ අනුව වැටුප් පරිමාණය රා.පරි.චක්‍ර 03/2016 පරිදි SL 1 – 2016 හි විධිවිධාන යටතේ ක්‍රියාත්මක වේ.

**04.** **බඳවා ගැනීමේ සුදුසුකම්**-

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. දකුණු පළාත් සභාවේ සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වසර 3 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
3. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවයේ III/II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය. නමුත් අංක:MREA/04/03/02-06 හා 2016.01.21 දිනැති ලිපිය මගින් I වන ශ්‍රේණියේ තනතුරක් ලෙස සංශෝධනය කිරීමට යෝජනා කර ඇති බැවින් I වන ශ්‍රේණියේ නිලධාරීන්ට අයදුම් කළ හැක.

**05.** **බඳවා ගැනීමේ ක්‍රමය** - දකුණු පළාත් සභාව තුළ සේවය කරනු ලබන හෝ ඉහත 4:2 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවාවට අයත් පශු වෛද්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට තෝරා ගනු ලැබේ. මෙහිදී නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතාවය පදනම් කර ගෙන සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. 2013.12.13 දිනැති 1840/51 අංක දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු 40 ද කුසලතාවය සඳහා ලකුණු 60 ද ලබා දෙනු ලැබේ.

➢ **ජ්‍යෙෂ්ඨත්වය සඳහා සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවයේ සතුටුදායක සේවා කාලය සලකා බලනු ලැබේ.**

අනුමත අංකය 272
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2016.10.06 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. සිටු 07 කි.

2016.10.11

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

272
ආණ්ඩු කාර්තුමා
2016.10.06
07
02
2016.10.

**කුසලතාවය : -**

කුසලතාව සඳහා ලකුණු ප්‍රමාණය 60% කි. එය නිලධාරියාගේ

- කාර්යසාධනය
- අධ්‍යාපනය හා වෘත්තීය සුදුසුකම්
- විශේෂ දක්ෂතා

**යන අංශයන් යටතේ අමුණා ඇති උපලේඛන අංක: 01 අනුව ලකුණු ප්‍රදානය කරනු ලැබේ.**

**06.** අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දකුණු පළාත් ප්‍රධාන ලේකම්, විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් සහ දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යන අයගෙන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් හෝ සමන්විත විය යුතුය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව 3 කට සීමාවිය යුතුය.

**07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි : -**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සියළුම කොන්දේසි මෙම තනතුර සඳහා ද බලපැවැත්වේ. එයට අමතරව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන කොන්දේසිවලට යටත් විය යුතුය.

**08. උසස් කිරීමේ ක්‍රමය : -**

සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ සිට වෙනත් තනතුරකට උසස්වීමක් මෙම පටිපාටිය අනුව හිමි නොවන අතර, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සේවයේ ව්‍යවස්ථාව ප්‍රකාරව හිමි වන උසස්වීම් පිළිබඳව කිසිදු බාධාවක් නොමැත.

**09. තනතුරට අදාළ රාජකාරී සහ වගකීම් : -**

1. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන කටයුතු සැළසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම.
2. දිස්ත්‍රික්කය තුළ පශු වෛද්‍ය කාර්යාල අධීක්ෂණය, පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
3. දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තු සතු සම්පත් උපරිම ලෙසින් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම.
4. දිස්ත්‍රික්කය තුළ කෙරෙන සියලු සංවර්ධන කටයුතු පසු විපරම් කිරීම හා ඇගයීම් කිරීම මගින් ගැටළු සඳහා අවශ්‍ය වන විසඳුම් නිර්දේශ කිරීම හා ක්‍රියාවේ යෙදවීම.
5. දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන සහ සම්බන්ධීකරණ රැස්වීම් සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම සහ වගකීම දැරීම.

6. දිස්ත්‍රික්කය තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රගතිය වැඩි කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සහ නිර්දේශ කිරීම සහ අදාළ දිස්ත්‍රික්කයේ නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් කටයුතු, දෛනික කාර්ය මාලා සහ ගමන් වියදම් පත් පරීක්ෂා කර ඉදිරිපත් කිරීම.
7. පශු සම්පත් සංවර්ධන කටයුතු සඳහා අනෙකුත් ආයතනවලට සහාය දැක්වීම.
8. දිස්ත්‍රික්කයේ අභිජනන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා කෘත්‍රිම සිංචනය ප්‍රවර්ධනය කිරීම.
9. මීට අමතරව දිස්ත්‍රික්කය තුළ පැන නගින දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වූ සංවර්ධන කටයුතු, අනෙකුත් ආයතනවලින් කෙරෙන ඉල්ලීම් සහ විමසීම් සහ සත්ත්ව පාලනයට අදාළ සියලුම තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් පූර්ණ වගකීම් දැරීම.
10. දිස්ත්‍රික්කයේ සත්ත්ව පාලන කටයුතු සම්බන්ධව දත්ත පවත්වා ගෙනයාම, විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල පළාත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශය වෙත තොරතුරු ලබා දීම.

සකස් කළේ: - ලෙස්ලි පිරිස්

අත්සන :

පරීක්ෂා කළේ: -

අත්සන :

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

පරිපාලන නිලධාරි
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපේ - මාතර.

නිර්දේශ කර ඉදිරිපත් කරමි,

අත්සන :

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර :

නිල මුද්‍රාව:

එච්. බී. එස්. රාමනායක
පළාත් අධ්‍යක්ෂ (දකුණ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපේ - මාතර.

දිනය : 2016 . 08 . 04

අනුමත අංකය 272
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2016 . 10 . 06 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 07 කි.

2016 . 10 .

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

(4)



යොමු අංකය :

[illegible] හි [illegible]

තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම : ඒ.යූ. වේලාරත්න

ලේකම්

ධීවර, සත්ත්ව නිෂ්පාදන....අමාත්‍යාංශය

දිනය : 2016/08/26

නිල මුද්‍රාව :

ඒ.යූ. වේලාරත්න
ලේකම්
ධීවර, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය, දකුණු පළාත

---

යොමු අංකය:

................................................ හි ................................................

සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2016.09.14 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම : ................................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2016.09.21

නිල මුද්‍රාව :

අනුමත අංකය 272
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2016.10.06 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 07 කි.

2016.10.11

(5)


................ අංකය ..272..
උකුණු පළාත් ........ ආරාත්‍රක්කරතුමා
විසින් ..2016.10.06.. ...ාට ඇති බව
සහතික කරමු. 07
2016.10.11


(2)

# උපලේඛන : 01

| අංක | ප්‍රධාන ක්ෂේත්‍රයන් | සලකා බලන සුදුසුකම් | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|---|
| 01 | සතුටුදායක සේවා කාලය | ▪ II ශ්‍රේණිය හා I ශ්‍රේණියේ සේවා කාලය සලකා බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වූවන් අතුරින් II ශ්‍රේණිය හා I ශ්‍රේණියේ උපරිම සේවා කාලයක් ඇති නිලධාරීන්ට උපරිම ලකුණු ප්‍රමාණය (එනම් ලකුණු 40) හිමිවන අතර,<br><br>▪ සෙසු අයදුම්කරුවන් සඳහා ඊට සමානුපාතිකව සේවා කාලය වෙනුවෙන් ලකුණු ලබා දීම සිදු කෙරේ.<br><br>උදාහරණ: -<br><br>▪ II ශ්‍රේණිය හා I ශ්‍රේණියේ වර්ෂ 10 ක සේවා කාලයන් සහිත නිලධාරියෙකු උපරිම සේවා කාලය සහිත නිලධාරියා නම් ඔහුට පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br>▪ 40/ 10 X10 =40 යි<br>▪ වසර 07 ක සේවා කාලයක් ඇති නිලධාරියෙකුට පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br>▪ 40 / 10 X 07 = 28 යි<br>▪ මාස 06 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සඳහා වසරකට හිමි ලකුණු ප්‍රමාණයෙන් භාගයක් දෙනු ලැබේ. මාස 06 ට අඩු සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. | | 40 |
| 02 | කාර්ය සාධනය | පූර්වාසන්න වසර 05 ක කාර්ය සාධනය සලකා බලනු ලැබේ.<br><br>▪ විශිෂ්ඨ<br>▪ සාමාන්‍ය මට්ටම හා ඊට වඩා ඉහළ<br>▪ සතුටුදායක | <br><br>04<br>03<br>01 | 20 |
| 03 | දේශීය හා විදේශීය පුහුණු | පශු සම්පත් ක්ෂේත්‍රය හෝ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ දේශීය හෝ විදේශීය පුහුණු සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>▪ දින 03 සිට 05 දක්වා<br>▪ දින 05 සිට මාස 01 දක්වා<br>▪ මාස 01 කට වැඩි | <br><br>01<br>02<br>03 | 05 |

අනුමත අංකය 272
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2016.10.06 ට ඇති බව
සහතික කරමු. 07
2016.10.11
... ලේකම්
දකුණු පළාත



| | | | | |
|---|---|---|---|---|
| 04 | අධ්‍යාපන සුදුසුකම් | ▪ පශ්චාත් උපාධිය<br>▪ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 05<br>03 | 05 |
| 05 | පරිගණක කුසලතාව | තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත් ආයතනයකින් ලබාගත් පුහුණු පාඨමාලාවක් සඳහා<br>• දින 02- සති 01 දක්වා<br>• සති 01 ට වැඩි - සති 02 දක්වා<br>• සති 02 ට වැඩි - සති 03 දක්වා<br>• සති 03 ට වැඩි - සති 04 දක්වා<br>• සති 04 ට වැඩි | 01<br>02<br>03<br>04<br>05 | 05 |
| 06 | විශේෂ ව්‍යාපෘති | පශු සම්පත් ක්ෂේත්‍රයේ තමන් විසින්ම සකස් කරන ලදුව, වෙනත් දෙපාර්තමේන්තු හෝ ආයතනවලින් හෝ විදේශ වලින් මූල්‍ය ප්‍රතිපාදන සපයාගෙන ක්ෂේත්‍රයේ කරන ලද ප්‍රතිඵල සහිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. (ලිඛිත වාර්තා මගින් ඉදිරිපත් කළ යුතුය)<br>▪ එක් ව්‍යාපෘතියක් සඳහා<br>(උපරිම ව්‍යාපෘති 02 කි) | 04 | 08 |
| 07 | ස්වයං නිර්මාණ | ඉහත 04 හි සඳහන් උපාධි පශ්චාත් උපාධි හැර තමන් විසින්ම ක්ෂේත්‍රයේ නිර්මාණාත්මකව කරන ලද ලිපි ලේඛන සහිත ප්‍රතිඵල ලබාගත් ක්‍රියාකාරකම් හෝ විෂය සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ සහ නිර්මාණ හෝ පිළිගත හැකි සංගමයකට හෝ සම්මේලනයකට ඉදිරිපත් කරන ලද විද්‍යාත්මක ප්‍රකාශනයක් හෝ ප්‍රකාශන.<br>▪ එක් ප්‍රකාශනයක් සඳහා | 2.5 | 05 |
| 08 | ප්‍රශංසාත්මක ලිපි | යම් නිලධාරියෙකු විසින් පශු සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයේ, ප්‍රගතියට හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට කීර්තියක් අත්කර දීම වෙනුවෙන් නිලධරයා විසින් ලබා දී ඇති සෘජු දායකත්වය අගයමින් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඊට ඉහළ නිලධාරියෙකු විසින් අදාළ ආකෘතිය පදනම් කර ගනිමින් ප්‍රදානය කරන ලද ප්‍රශංසාත්මක ලිපි. (පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර තිබිය යුතුය)<br>▪ එක් ප්‍රශංසාත්මක ලිපියක් සඳහා | 2.5 | 05 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | ඉදිරි සැළසුම් පිළිබඳ ඉදිරිපත් කිරීම | අයදුම්කළ තනතුරට පත් කළහොත් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ඉදිරි සැළසුම් පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදුකිරීම (පරිගණක ආශ්‍රයෙන් විනාඩි 05 ක කාලයක් ඉදිරිපත් කිරීම කළ යුතුය) | | 04 |
| 10 | පෞරුෂත්වය | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණ පදනම් කර ගෙන ලකුණු ලබා දෙනු ලැබේ. | | 03 |

අනුමත අංකය 272
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2016 . 10 . 06 ... ඇති බව
සහතික කරමි. 07

2016 . 10 . 11
... ලේකම්
දකුණු පළාත